


# Nanda Malini : a breeze that empowers
# ශ්‍රාවක සිතට ජීවය පිඹින කටහඬ

Childhood melodies have a way of staying with us long years after we first hear them. Children, naturally, are less concerned with the singer than with the song. When I heard Nanda Malini's voice and the melodies that were sent rippling along the air ways by what was then the Ceylon Broadcasting, I immediately took a liking to songs such as **Buddhanu Bhavena** and 'Mal Mal Heenaya'.

My growing up was accompanied in many ways by her two popular concerts, 'Satyaye Geethaya' (the song of truth) and 'Pavana' (wind). In fact it is probably true that the political maturing of my generation, especially its rural and non-English speaking sections, owes much to Nanda Malini and her commitment to the belief that the song has a social purpose.

Looking back, Nanda Malini said that the person who had inspired and helped her most in her music life had been Pundit Amaradeva. "I picked up many things from him. He taught me how to infuse power into the word," she said. She also acknowledged the massive contribution of Sunil Ariyaratne. "He has written about 75% of the lyrics of my songs, beginning with 'Sakura Mal', which was his first song and the first song to which I put the melody.

Neither political suppression nor geographical boundary has been successful in containing the voice of this indomi table woman. Her songs constitute a breeze that has touched people in about 30 countries. She has performed on all continents and makes one or two tours every year, beginning with her London concert in the early eighties.

We live in a nation where you can be guaranteed that if you do a quick run through all the radio stations the chances are that almost all the songs will be about love, i.e. nothing too different from the perennial themes, "I love you, you love me, how nice!" or "I love you, why don't you love me?" or the inevitable complaint, "you don't love me anymore!"

If all poetry and all literature in fact followed the same themes, we would be quite poor as a nation, for love, especially romantic love, constitutes only one element of the human condition and its multi-faceted concerns. It is in this context that one song from pawana comes to my mind.

'Vahinnata hekinam gigum dee, viyali gam bim valata ihalin,

Idennata hekinam bathak vee, bathak no-idena pelaka rahasin'

Nanda Malini is a fertile wind that has swept across our cultural sensibilities. She has indeed watered the hard earth of a barren land and infused nourishment into despairing hearts. She has, over her long career, spared no pains to awake her people, nurture a new generation and teach all of us the worth of a principled existence where constant and active engagement is the only way in which we can be at peace with our conscience.

♦ **Malinda Seneviratne**

ළමා වියේදී අප ප්‍රථමයෙන් ඇසූ මියුරු ගායනා ඒ මොහොතේ පටන් දීර්ඝ කාලයක් අප තුළ රැඳී පවතින ස්වභාවයක් ඇත. ගායකයා හෝ ගායිකාව ගැන නොව ළමා සිත නිසගයෙන් බැඳෙන්නේ ගීතයේ වචන හා ගායන මාධූර්යය කෙරෙහිය. නන්දා මාලිනියගේ සුමධුර නද ඒ යුගයේ ගුවන් විදුලි සංස්ථාවේ විකාශනයකින් ගුවන සිසාරා විහිදී ගිය එක් දිනක ඒ ගී කෙරෙහි මගේ සිත තදින් බැඳිණ.

වයසින් වැඩෙනවාත් සමග නන්දාගේ **සත්‍යයේ ගීතය** සහ **පවන** නම් ප්‍රසංග නැර ඹීමි. මගේ පරම්පරාවේ තරුණ පෙළ, විශේෂ යෙන් ගම්බද වසන, ඉංග්‍රීසිබස නොව සිංහළ බස හුරු තරුණ උදවියගේ දේශපාලනික මුහුකුරායෑමට කිසියම් බලපෑමක් හා පන්නරයක් ඒ ගායනාවලින් ලැබුණ බව සැබෑවකි. මන්ද, ගීතය විශේෂ සමාජ කාර්‍යයක් ඉටු කිරීම පිණිස යොදාගත යුතුය යන්න ඇයගේ විශ්වාසය බැවිනි.

විශාරද අමරදේවයන් තම සංගීත ජීවිතයේ ප්‍රගමනයට බෙහෙවින් බලපෑ කෙනෙකි යි නන්දා පවසයි. එසේම ඇයගේ ගීතවලින් විශාල සංඛ්‍යාවක පද රචනය කර ඇත්තේ මහාචාර්ය සුනිල් ආරියරත්නයන්ය. **සකුරා මල් පිපිලා** ඔහු ඇයට ලියූ මුල්ම ගීතයයි. එසේම එය නන්දා විසින් තනුවක් යොදන ලද මුල්ම ගීතයද වන්නේය. ඇයගේ ගී ගැයුම් ශ්‍රීලංකාව පුරා ශ්‍රාවක සිත්සතන් ප්‍රභාමත් කරන්නාසේම ඒ ගී දේශ දේශාන්තරයන්හි රසික දන ස්පර්ශ කරන්නට ද සමත්ව ඇත. රටවල් 30 ක පමණ ඇගේ ප්‍රසංග පවත්වා තිබේ.

"මම ආදරෙයි.... මට ආදරේද...." ආදී සුලභ සිල්ලර වචන යෙදූ ප්‍රේමගීත අපට නිතර දෙවේලේ ඇසේ. සියළු සාහිත්තික යෙදුම් එසේ වුවහොත් අප ජාතියක් හැටියට දිළිඳු ය. ආදරය එයට වඩා පැතිකඩවල් රාශියකින් යුත් මානව හැඟීම් සමුදායකි.

නන්දා මාලිනියගේ මෙම ගීතය මගේ සිත් ඇදගත්තේ එහි සුවිශේෂත්වයක් ඇති නිසයි.



වහින්නට හැකිනම් ගිගුම් දී වියලි ගම් බිම් වලට ඉහළින්
ඉදෙන්නට හැකිනම් බතක්වී බතක් නොයිදෙන පැලක රහසින්

නන්දා මාලිනී යනු අපේ සංස්කෘතික සංවේදීතාවන් හරහා හමා යන සාරවත් සුළං රැල්ලකි. සැබවින්ම ඇය නිසරු බිමක කාෂ්ටක පොළව මත ජලය ඉසීමෙන් අප්‍රමාණ අපේක්ෂා බිඳගත් හදවත් තුළට ජීවයක් කවන්නීය. මෙතුවක් ආ දිගු ගමනේ ඇය තම රසික ජනතාව අවදිකරන්නටද නව පරපුරක් පෝෂණයකර හදාවඩා ගන්නට ද ඉමහත් වෙහෙසක් දරා ඇත. එසේම කෙනෙකුට තම හදවතට අනුව ජීවත්විය හැක්කේ ප්‍රතිපත්තිගරුක පැවැත්මකින් බවද ඇය අප සැමට උගන්වා තිබේ.

♦ **මලින්ද සෙනෙවිරත්න**